# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ඇබෑර්තු

ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. කාර්මික නිලධාරී තනතුර - II ශ්‍රේණිය "A" කොටස

**සුදුසුකම් :**

01. තාක්ෂණවේදය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ ඒ හා සමාන සුදුසුකම්

    හෝ

02. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

    හෝ

03. අදාළ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව

    හෝ

04. පිළිගත් ආයතනයකින් ලබාගත්, අවම වසර 02 ක පූර්ණ කාලීන කාලසීමාවක් සහිත අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසකර පළපුරුද්ද.

**සටහන :** තනතුරේ ස්වභාවය අනුව, අදාළ ක්ෂේත්‍ර වනුයේ ඉංජිනේරු, විද්‍යා/ තාක්ෂණවේදය/ වෛද්‍ය රසායනාගාර තාක්ෂණය ආදිය වේ.

**වයස් සීමාව** : වයස අවු. 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමවේදය** : U-MT$_1$ (III)

රු. 35,145-7X355; 9X495-42,085 (මාසිකව) (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 (V) අනුව)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 02. තාක්ෂණික නිලධාරී තනතුර (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය.

**සුදුසුකම් :**

01. අ.පො.ස. උ/පෙ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 03 ක් සමත්වී තිබිය යුතුයි.

සහ

02. (a) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හෝ පාර්ලිමේන්තුව මගින් සම්මත කළ පනතක් මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් මගින් පිළිගත් ආයතනයක,ඉලෙක්ට්‍රෝනික විද්‍යාව හා විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පක්‍රම පිළිබඳ NVQ 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

    හෝ

    (b) ඉහත (2) (a) හි සුදුසුකම්වලට සමාන ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ විදුලි සංදේශ/ ඉලෙක්ට්‍රෝනික විද්‍යාව/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය ශිල්පක්‍රම ක්ෂේත්‍රයේ. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සහ ශ්‍රව්‍යදෘශ්‍ය කාර්යයන් පිළිබඳ පිළිගත් ආයතනයක වසර 01 ක පළපුරුද්ද.

**වයස් සීමාව** : වයස අවු. 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමවේදය** : U-MT$_1$ (III)

රු. 31,625-7X300;10X355-37,275 (මාසිකව)

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016(V) ට අනුව)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 03. කාර්මික නිලධාරී තනතුර (සිවිල්) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාවේ විෂයන් 03 ක් සමත්වී තිබිය යුතුයි.

    සහ

2. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ NVQ 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක්.

**වයස් සීමාව** : වයස අවු. 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමවේදය** : U-MT$_1$ (III)

රු. 31,625-7X300;10X355-37,275 (මාසිකව)

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016(V) ට අනුව)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 04. කාර්මික නිලධාරී තනතුර (විදුලි) III ශ්‍රේණිය

**සුදුසුකම් :**

1. අ.පො.ස. උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් 03 ක් සමත්වී තිබිය යුතුයි.

    සහ

2. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ NVQ 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක්.

**වයස් සීමාව** : වයස අවු. 18 ට නොඅඩු සහ වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමවේදය** : U-MT$_1$ (III)

රු. 31,625-7X300;10X355-37,275 (මාසිකව)

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016(V) ට අනුව)

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## අයදුම් කිරීමේ ක්‍රමය :

අයදුම් කිරීමේ ආකෘති පත්‍ර විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන (www.kln.ac.lk) වෙතින් බාගත කළ හැක. නිසි ලෙස, නියමිත ආකෘති පත්‍රවල සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතික පත්‍ර සමග, අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර, "**සහකාර ලේඛකාධිකාරී - අනධ්‍යයන ආයතන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය**" යන ලිපිනයට 2021 අප්‍රේල් 20 වන දිනට හෝ ඊට පෙර ලැබීමට සලස්වන්න.

උසස් අධ්‍යාපන ආයතන, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වල අයදුම්කරුවන් හට වයස් සීමාව අදාළ නොවන අතර, ඔවුන්ගේ අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානී හරහා යොමු කළ යුතුය.

අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපැහැදිලි සහ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඉන් අනතුරුව කිසිදු හේතුවක් මත ඒවා සළකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2021-03-25**